# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2032/26 - 2017 අගෝස්තු මස 16 වැනි බදාදා - 2017.08.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය - සංශෝධන අංක 01**

2013. දෙසැම්බර් මස 11 දින හා අංක : 1840/34 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝග කොට ඇත.

1. **7.3.2.3 වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ.**

   7.3.2.3 පළපුරුද්ද

   නියමිත දිනට රජයේ සේවයේ ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කොට තිබිය යුතුය.

   (මේ යටතේ වූ පැහැදිලි කිරීම එසේම පවතිනු ඇත)

2. **7.3.2.5 වගන්තිය යටතේ සඳහන් අනුවගන්තීන්හි අවසානයට අනු අංක. (iv) ලෙස පහත වගන්තිය ඇතුළත් කරනු ලැබේ.**

   7.3.2.5 වෙනත්

   (iv) නියමිත දිනට පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

3. **8.3 වගන්තිය ඉවත් කර පහත වගන්තිය ආදේශ කරනු ලැබේ.**

   8.3 පවත්වන බලධරයා - විභාග කොමසාරිස් ජනරාල් හෝ පත්වීම් බලධාරියා විසින් බලය පවරන ලද ආයතනයක්

4. **10.3.1.1 ඡේදයේ (අ)(iii) වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කරනු ලැබේ.**

   (iii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය සමත් සේවයේ වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිළධාරියෙකු වීම.

5. **10.3.1.2 ඡේදය ඉවත් කර පහත ඡේදය ආදේශ කරනු ලැබේ.**

   10.3.1.2 උසස් කිරීමේ ක්‍රමය

   අධි ශ්‍රේණියේ පුරප්පාඩු වලින් 50% ක ප්‍රමාණයකට අදාල පත්කිරීම් කරනු ලබන්නේ සීමිත තරඟ විභාගයක ප්‍රතිඵල මතය. සීමිත තරඟ විභාගය සමත්වීම සඳහා විභාගයට අදාල එක් එක් විෂයයන්ට අවම වශයෙන් ලකුණු 40ක් ලබා ගත යුතුය. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පත් කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ සුදුසුකම් සනාථ කෙරෙන සහතික පරීක්ෂා කිරීම සඳහා පමණක් වන අතර එහිදී ලකුණු දීමක් සිදු නොවේ. (විෂය නිර්දේශය සහ ලකුණු ලබා දීමේ පටිපාටිය 09 ඇමුණුමේ දැක්වේ.)

1A - G 26081 — 09 (2017/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**6. 10.3.2.2 ඡේදය ඉවත් කර පහත ඡේදය ආදේශ කරනු ලැබේ.**

10.3.2.2 උසස් කිරීමේ ක්‍රමය

අධි ශ්‍රේණියේ පුරප්පාඩු වලින් 50% ක ප්‍රමාණයකට අදාල පත්කිරීම් කුසලතා පදනම මත සිදු කරනු ලැබේ. මේ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අභියෝගතා පරීක්ෂණයකට මුහුණ දී එක් එක් විෂයන්ට අවම වශයෙන් ලකුණු 40ක් ලබා සමත් විය යුතුය. එහි ප්‍රතිඵල මත හා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් ජ්‍යෙෂ්ඨතාව හා පලපුරුද්ද පදනම් කරගෙන දෙනු ලබන ලකුණු වල එකතුවේ අනුපිළිවෙල අනුව ප්‍රමුඛත්වය තීරණය කරනු ලැබේ. කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන මණ්ඩලයක් ඉදිරියේ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට අයදුම්කරුවන් පෙනී සිටිය යුතුය. එම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ. (ඇමුණුම 10)

**7. ඇමුණුම 04 යටතේ ඇති 'සටහන' කොටස වෙනුවට පහත සඳහන් කොටස ඇතුලත් කරනු ලැබේ.**

*සටහන 01*

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉමට අදාල පරිගණක පරීක්ෂණයෙන් පහත අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන් නිදහස් කරනු ලැබේ.

01. පහත ආයතන වලින් ලබා දෙන සේවා ව්‍යවස්ථාවේ දැක්වෙන පරිගණක පාඨමාලාවේ විෂය නිර්දේශයට සමාන විෂය නිර්දේශයක් යටතේ ඇති පරිගණක පාඨමාලා හදාරා ඇති නිලධාරීන්

a. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA)
b. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
c. වෘත්තීය පුහුණු අධිකාරිය
d. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ඇති කාර්මික විද්‍යාල හා තාක්ෂණ විද්‍යාල මගින් පවත්වනු ලබන පාඨමාලා
e. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාල හෝ වෙනත් ආයතන
f. ජාතික තරුණ සේවා සභාව

02. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යා උපාධිය හෝ උපාධිය සඳහා පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති නිලධාරීන්

*සටහන 02*

මෙම සංශෝධන *ගැසට් පත්‍රය* ප්‍රකාශයට පත් කරන දින සිට වසර 02ක කාලයක් දක්වා අංක 1840/34 හා 2013.12.11 දිනැති කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ ඇමුණුම 04 හි සටහනේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන නිලධාරීන්ද පරිගණක පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

08 - 1069

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.